මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා රජය, මුහුදු කොල්ලකරුවන් විසින් පැහැරගන්නා ලද "ඇරිස් 13"නෞකාව හා ශ්‍රී ලාංකික නැවියන් මුදා ගනියි.

මුහුදු කොල්ලකරුවන් විසින් පැහැර ගන්නා ලද "ඇරිස් 13" නෞකාව ඇතුළු ශ්‍රී ලාංකික නැවියන් ඊයේ රාත්‍රියේ පසුභාගයේ එනම් මාර්තු 17 දින අලුයම් කාලයේදී මුදාහැර ඇතිබව අමාත්‍යාංශය සතුටින් ප්‍රකාශ කරයි. මෙම නැවියන් කිසිදු උපද්‍රවයකින් තොරව, කප්පම් ලබාගැනීමක් නොමැතිව මුදාහරිනු ලැබ ඇත.

සෝමාලියා අර්ධ-ස්වාධීන කලාපය වන පුන්ට්ලන්ත ජනාධිපතිවරයා වෙතත්, නෞකාව හා නැවියන් මුදා ගැනීමේදී ශ්‍රී ලංකාවේ අදාළ නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ පුන්ට්ලන්ත ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී අබ්දිනාසිර් සොෆේ මහතා වෙතත් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මෙම අමාත්‍යාංශය සිය ප්‍රසාදය පළකර සිටී. ඔවුන් දරන ලද අප්‍රතිහත උත්සාහය නිසා මෙම කර්තව්‍යය සාර්ථක කරගැනීමට හැකිවිය.

මෙම කර්තව්‍යයේදී සහයෝගය ලබාදුන් ඇමරිකා එක්සත් ජනපද රජයටත්, ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපතිවරයාටත්, බහරේනයේ ඒකාබද්ධ නාවික හමුදාවටත්, යුරෝපා සංගමයටත්, අනෙකුත් සියළු රජයන්, සංවිධාන හා පුද්ගලයන්ටත්, ශ්‍රී ලංකාවේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පුද්ගලයන්ටත් ශ්‍රී ලංකා රජය සිය කෘතවේදීත්වය පළකර සිටී.

ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ

2017.03.17